(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 132.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

2011 නොවැම්බර් මස 08 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0943/'10

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, මුලටියන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනයවන රජයේ පාසල් අතරින්,

(i) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල් කවරේද;

(ii) එම පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පාසල් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1000/'10

2.

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සේවක භාරකාර අරමුදලේ (ETF) මේ වන විට තැන්පත් කර ඇති මුදල;

(ii) එහි සාමාජිකත්වය ලබා ඇති සේවක සංඛ්‍යාව;

(iii) සාමාජිකයින්ගේ මුදල් වෙනුවෙන් ලබා දෙන වාර්ෂික පොලී අනුපාතය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම මුදල් සාමාජිකයන්ට නැවත ලබා දීමේ වර්ෂ 5 කාල සීමාව දීර්ඝ කර තිබේද;

(ii) නොඑසේ නම්, එවැනි කාලය දීර්ඝ කිරීමක් සඳහා සැලැස්මක් සකසා තිබේද;

(iii) ඉහත (ආ) (i) හෝ (ii) සිදුකර ඇත්නම්, එයට හේතු වූ කරුණු කවරේද;

(iv) ඒ සඳහා කම්කරු උපදේශන සභාවේ අනුමතිය ලබාගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) කෙටි කාලීන අවශ්‍යතා සපුරා ගැනීම වෙනුවෙන් සේවක භාරකාර අරමුදලේ මුදල් භාවිතා කරන සේවකයින් මුහුණ දෙන ගැටලු සඳහා ලබා දෙන විසඳුම කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1225/'11

3\.
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1619/'11

4\.
ගරු අනුර දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවට ආසනික් අඩංගු කෘෂි රසායන ගෙන්වීම නතර කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) පසුගියදා දේශීය වෙළඳපොලෙහි ආසනික් අඩංගු කෘෂි රසායන තිබෙන බවට පළවූ වාර්තා පිළිබඳව අමාත්‍යාංශය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

(ii) කෘෂි රසායන ලංකාවට ගෙන ඒමේදී පරීක්ෂාවට භාජනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1014/'10

5\.
ගරු දයාසිරි ජයසේකර මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා ශ්‍රී ලංකාව ලෝකය තුළ ප්‍රචාරණය කිරීම සඳහා යම් මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබේද;

(ii) එම මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) ඒ අනුව, එම වැඩසටහන සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ ප්‍රචාරණ ආයතන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ආයතන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ආයතන අතරින් "බෙල්පොටින්ජර්" නම් බ්‍රිතාන්‍ය සමාගමක් එම වැඩසටහන ප්‍රචාරණය සඳහා ඇතුළත්කරගෙන තිබේද;

(ii) ඔවුන්ගෙන් ලබාගත් සේවාවන් කවරේද;

(iii) එම ආයතනය සඳහා ගෙවන ලද මුළු මුදල හා එක් එක් කාර්යය සඳහා ගෙවන ලද මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1227/'11

6.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ක්‍රීඩා අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1278/'11

7.

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බෝපගොඩ "සුරම්‍යා" හි පදිංචි දයාවතී හෙට්ටිආරච්චි මහත්මියට අයත් මාරඹ, පෙද්දපිටිය උතුර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි, වලකන්දවත්ත නැමැති තේ වගා ඉඩමේ පර්චස් හතරක පමණ ප්‍රමාණයක මීන් වර්ෂ 10කට පෙර වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ජල විද්‍යා අංශය මගින් නිල්වලා ගඟේ ජල මිණුම් කටයුතු සඳහා යැයි පවසමින් කුළුණක් ඉදිකර ඇති බවත්;

(ii) මේ දක්වා එම කුළුණින් කිසිදු ප්‍රයෝජනයක් ගෙන නොමැති බවත්;

(iii) කුළුණ ඉදිකිරීම සඳහා අත්පත්කර ගත් ඉඩම වෙනුවෙන් මේ දක්වා ඉඩම හිමිකාරියට වන්දි මුදලක් හෝ බදු මුදලක් ගෙවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ජල මිණුම් කුළුණෙහි කටයුතු අතරමග නවතා දැමීමට හේතු කවරේද;

(ii) අත්පත්කරගත් ඉඩම වෙනුවෙන් දයාවතී මහත්මියට වන්දි මුදලක් ගෙවීමට හෝ ඉදිකිරීම් කටයුතු සිදු නොකරන්නේ නම්, ඉඩම නැවත ලබා දීමට කටයුතු කරන්නේද;

(iii) වන්දි මුදලක් ලබා දෙන්නේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1620/'11

8.

ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 ජුනි මාසය වන විට මහ බැංකුව සතුව තිබූ රත්‍රන් ප්‍රමාණය කොපමණද;

(ii) වර්ෂ 2010 ජුනි සිට 2011 ජුනි දක්වා මිලදී ගත් හා අලෙවි කළ රත්‍රන් තොග ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් එක් අවස්ථාවේදී රත්‍රන් මිලදීගත් ආකාරය කවරේද;

(iv) එක් එක් අවස්ථාවේදී අලෙවි කරන ලද රත්‍රන් ප්‍රමාණයන්හි මිල ගණන් කවරේද;

(v) රත්‍රන් අලෙවි කිරීම සඳහා අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1015/'10

9.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 වර්ෂය සඳහා ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය යටතේ නිවාස ඉදිකිරීම් සඳහා වෙන්කර ඇති මුළු මුදල කොපමණද;

(ii) එම මුදලින් ග්‍රාමීය නිවාස, රජයේ නිවාස හා මහල් නිවාස ඉදිකිරීම සඳහා වෙන්කර ඇති මුදල් ප්‍රමාණයන්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත නිවාස ව්‍යාපෘති සඳහා විවිධ රටවල්වලින් ණය හෝ ආධාර ලබාදී තිබේද;

(ii) එසේ නම්, ණය හෝ ආධාර ලබා දුන් රටවල් සහ එක් එක් රටෙන් ලබා දුන් මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1230/'11

10.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1280/'11

11\.
ගරු බුද්ධික පතිරණ මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, "දර්ශන" කප්පරතොට ලිපිනයෙහි පදිංචි එස්. ටී. කේ. ජයවීර මහතාගේ නිවසට සහ ගෘහ භාණ්ඩවලට 2004. 12. 26 දින ඇති වූ සුනාමිය නිසාවෙන් හානි සිදු වී ඇති බවත්;

(ii) එම හානිය වෙනුවෙන් වන්දි මුදලක් හෝ නව නිවසක් ලබාදෙන මෙන් ඒ මහතා විසින් වර්ෂ හයකට ආසන්න කාලයක් තිස්සේ අදාළ අංශ වෙත ඉල්ලීම් කළද මේ දක්වා එය ඉටු නොවීමෙන් ඔහු දැඩි ලෙස අසරණ වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) හානියට පත් ඔහුගේ නිවස ප්‍රතිසංස්කරණය කර ගැනීම සඳහා වන්දි මුදලක් හෝ වෙනත් ස්ථානයකින් නව නිවසක් ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1621/'11

12\.
ගරු අනුර දිසානායක මහතා,— සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මිහින් ලංකා ආයතනයේ වත්මන් ඉහළ නිලධාරී මණ්ඩලයේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කරනු ලබන අය කවුරුන්ද;

(ii) එම එක් එක් නිලධාරියාගේ හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයාගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් කවරේද;

(iii) එම නිලධාරීන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ලබන වැටුප්, දීමනා හා අනෙකුත් වරප්‍රසාද කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මිහින් ලංකා ආයතනයේ 2010 වර්ෂයේ ශේෂ පත්‍රය අනුව රුපියල් බිලියන 5.6ක වත්කම් හිඟයක් පවතින්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා බලපෑ හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ඌන ක්‍රියාකාරී ව්‍යවසායයන් සහ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ,— හඳුනාගත් ඌන ක්‍රියාකාරී ව්‍යවසාය හෝ ඌන උපයෝජිත වත්කම් ජාතික යහපත උදෙසා රජය සතු කිරීම සඳහා ද; එම ඌන ක්‍රියාකාරී එක් එක් ව්‍යවසාය හෝ ඌන උපයෝජිත වත්කම සම්බන්ධයෙන් හෝ ඒ ව්‍යවසාය හෝ වත්කම් කීපයක් සම්බන්ධයෙන් නිසි බලධරයකු පත්කිරීම සඳහා ද; විකල්ප උපයෝජනය තුළින් ඒවායේ ඵලදායී කළමනාකරණය, පරිපාලනය හෝ පුනරුදය සඳහා විධිවිධාන සැලැස්වීම සහ ඒවා සම්බන්ධයෙන් වන්දි ගෙවීම පිණිස ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

2.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— නගර සහ ග්‍රාම නිර්මාණ (සංශෝධන),— (269 වැනි අධිකාරය වූ) නගර සහ ග්‍රාම නිර්මාණ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

3.

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල (සංශෝධන),— ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— 2011 නොවැම්බර් මස 22 වැනි අඟහරුවාදා, 23 වැනි බදාදා, 24 වැනි බ්‍රහස්පතින්දා, 25 වැනි සිකුරාදා, 28 වැනි සඳුදා, 29 වැනි අඟහරුවාදා සහ 30 වැනි බදාදා යන දිනයන් 'විසර්ජන පනත් කෙටුම්පත (2012)' සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය.

5.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග 70(2) හි කුමක් සඳහන් ව තිබුණද, 'විසර්ජන පනත් කෙටුම්පත (2012)' සලකා බැලීම සඳහා 2011 නොවැම්බර් මස 22 වැනි දින සිට නොවැම්බර් මස 29 වැනි දින දක්වා ඇති වෙන් කළ දිනයන්හි රැස්වීම් පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට ප. භා. 12.30 දක්වා ද, ප. භා. 1.00 සිට ප. භා. 6.30 දක්වා විය යුතු ය. ප.භා. 6.00ට ස්ථාවර නියෝග අංක 7හි (5) සහ (6) ඡේදයන් ක්‍රියාත්මක විය යුතු ය.

6.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— ස්ථාවර නියෝග 70(2) හි කුමක් සඳහන් ව තිබුණද, 'විසර්ජන පනත් කෙටුම්පත (2012)' සලකා බැලීම සඳහා 2011 නොවැම්බර් මස 30 වැනි බදාදා දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට ප. භා. 12.30 දක්වා ද, ප. භා. 1.00 සිට ප. භා. 5.00 දක්වා විය යුතු ය. ප. භා. 5.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

7.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ට්ස් සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සහ 2004 අංක 11 දරන මුදල් පනතේ 22 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 26 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් පනවන ලදුව, 2011 අගෝස්තු 04 දිනැති අංක 1717/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.10.18 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

ප්‍රවාහන අමාත්‍යතුමා,—මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 1),— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වැනි වගන්තිය සමග කියවිය යුතු, 141, 143, 144, 168 සහ 190 වගන්ති යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 අගෝස්තු 03 දිනැති අංක 1717/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.10.18 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

ප්‍රවාහන අමාත්‍යතුමා,—මෝටර් වාහන පනත යටතේ නියෝග (අංක 2),— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 19 සහ 157 අ වගන්ති යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 අගෝස්තු 09 දිනැති අංක 1718/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.10.18 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— 2012 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවෙන් තෝරාගත් අමාත්‍යාංශවල වැය ශීර්ෂයන් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

2012 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු පිළිබඳ කාරක සභා අවස්ථාවේ වැඩ සටහන සඳහා වෙන්කොට ඇති කාලසීමාව දින 17 ක් වන හෙයින් ද,

අයවැය කාරක සභා අවස්ථාවේ වැඩ සටහන සඳහා දිනකට පැය 7½ක් පමණ වෙන්කර ඇති අතර, එක් දිනකදී අමාත්‍යාංශ කිහිපයක වැය ශීර්ෂයන් පිළිබඳව සාකච්ඡා කිරීමට සිදුව ඇති හෙයින්, ඒ අනුව එක් වැය ශීර්ෂයක් සඳහා වෙන් කරනු ලැබ ඇත්තේ දළ වශයෙන් පැය 2 ක පමණ කාල සීමාවක් වන හෙයින් ද, ඒ අනුව එක් එක් අමාත්‍යාංශය තුළ වැය ශීර්ෂයන් සකස් කිරීම සඳහා වෙන් කර ඇති කාලය සීමා සහිත වන බැවින්ද, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමාගේ සහ විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමාගේ එකඟත්වය පරිදි පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ දී තීරණය කරන ලද ඇමුණුමේ සඳහන් අමාත්‍යාංශ 21ක වැය ශීර්ෂයන් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා විසර්ජන පනත් කෙටුම්පත (2012) පිළිබඳ දෙවැනිවර කියවීමේ විවාදය ආරම්භ කළ දින සිට, එනම් 2011.11.22 සිට 2011.11.29 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ රැස්වී සාකච්ඡා කළ හැකි වන පරිදි විශේෂ කාරක සභාවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකවරයා විසින් නම් කරනු ලැබිය යුතුය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, මෙම කාරක සභාව ආණ්ඩු පාර්ශ්වයෙන් හා විරුද්ධ පාර්ශ්වයෙන් තෝරාගනු ලැබූ සාමාජිකයන් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

3. ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට; සහ

(ආ) පුද්ගලයන්, ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගැනීමට ද පාර්ලිමේන්තුව හෝ සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමට ද;

බලය තිබිය යුතුය.

4. එකී තෝරාගත් අමාත්‍යාංශවල වැය ශීර්ෂයන්හි කාරක සභා අවස්ථාව ආරම්භ කරන දින හෝ එදිනට පෙර කාරක සභාව සිය වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

ඇමුණුම

1. යහපාලනය හා යටිතල පහසුකම් අමාත්‍යාංශය
2. නාගරික කටයුතු අමාත්‍යාංශය
3. පාරිභෝගික සුබසාධන අමාත්‍යාංශය
4. ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යාංශය
5. ග්‍රාමීය කටයුතු අමාත්‍යාංශය
6. ජාතික සම්පත් අමාත්‍යාංශය
7. මානව සම්පත් අමාත්‍යාංශය
8. සමාජ සුබ සාධන අමාත්‍යාංශය
9. විද්‍යාත්මක කටයුතු අමාත්‍යාංශය
10. ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය
11. පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
12. රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
13. ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය
14. තැපැල් සේවා අමාත්‍යාංශය
15. මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යාංශය
16. ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
17. රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය
18. සමාජ සේවා අමාත්‍යාංශය
19. පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය
20. සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
21. තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

7.

බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

8.

ශ්‍රී ධම්මාලංකාර සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

9.

රාමක්‍රිෂ්ණ සාරදා දූත මෙහෙවර (ලංකා ශාඛාව) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

10.

දෙහිවල, නැදිමාලේ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*11.

විසර්ජන පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*12.

රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*13.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව

*16.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව

*17.

සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*18.

විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*19.

විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*20.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*21.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.06.11 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*22.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.09.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝගාශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*23.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමිය,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2008,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.12.03 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික හා තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*24.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව 2008,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරි පනතේ 34 වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.06.30 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*25.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*26.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*28.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— "2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."

යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

29.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

30.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0944/'10

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මාතර කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, වැලිගම කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනයවන රජයේ පාසල් අතරින්,

(i) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල් කවරේද;

(ii) එම පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පාසල් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0945/'10

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, පස්ගොඩ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනයවන රජයේ පාසල් අතරින්,

(i) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල් කවරේද;

(ii) එම පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පාසල් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0946/'10

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, කොටපොල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනයවන රජයේ පාසල් අතරින්,

(i) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල් කවරේද;

(ii) එම පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පාසල් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0947/'10

4.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මාතර කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, දික්වැල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනයවන රජයේ පාසල් අතරින්,

(i) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල් කවරේද;

(ii) එම පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පාසල් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0948/'10

5.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මාතර කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, දෙවිනුවර කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් අතරින්,

(i) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල් කවරේද;

(ii) එම පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පාසල් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0949/’10

6.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, තිහගොඩ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් අතරින්,

(i) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල් කවරේද;

(ii) එම පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පාසල් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0950/’10

7.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, මාලිම්බඩ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් අතරින්,

(i) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල් කවරේද;

(ii) එම පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පාසල් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0951/'10

8.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, හක්මන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් අතරින්,

(i) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල් කවරේද;

(ii) එම පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පාසල් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0952/'10

9.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, කඹුරුපිටිය කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් අතරින්;

(i) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල් කවරේද;

(ii) එම පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පාසල් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0953/’10

10.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, අකුරැස්ස කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් අතරින්,

(i) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල් කවරේද;

(ii) එම පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පාසල් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0954/’10

11.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, වැලිපිටිය කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් අතරින්,

(i) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල් කවරේද;

(ii) එම පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පාසල් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, දෙනියාය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, මොරවක කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් අතරින්,

(i) ගොඩනැගිලි අවශ්‍යතා ඇති පාසල් කවරේද;

(ii) එම පාසල් සඳහා අවශ්‍ය ගොඩනැගිලි සංඛ්‍යාව කොපමණද;

(iii) සනීපාරක්ෂක පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනයක් ඇති වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය ප්‍රතිපාදන අදාළ පාසල් වෙත ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?